*සැ. යු.* - 2023.08.04 දින පළ වූ අංක 2344 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,345 - 2023 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2023.08.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 492 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 496 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීන් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 සැප්තැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### කොළඹ දිසා අධිකරණයේ දී ය

එස්. එම්. බී. ෆිනෑන්ස් පී. එල්. සී.
(කලින් එස්. එම්. බී. ලීසිං පී. එල්. සී. යනුවෙන් නම් කොට හඳුන්වන ලද)

අංක 282/1,
සී.බී.එස්. ගොඩනැගිල්ල,
ගාලු පාර, කොළඹ 03.

*නඩු අංකය* : DMB/168/2022
*ඇස්කිසි අංකය* : 110/23
*ස්වභාවය* : උකස්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. 6,398,459.01

*...............පැමිණිලිකරු.*

*එදිරිව*

මංජුල පද්ම කුමාර මුණසිංහ,
අංක 119/B,
රුප්පාවත්ත, දියලපේ, අකුරැස්ස,

*සහ*

අංක 100, දෙනියාය පාර, අකුරැස්ස.

*...............විත්තිකරු.*

වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින මෙම නඩුවෙ හි ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී විත්තිකරුට එරෙහිව ඉහත නම් කර ඇති විත්තිකරුට විරුද්ධව පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති පරිදි පැමිණිලිකරුගේ වාසියට මෙම නඩුව තීන්දු ප්‍රකාශ කරනු ලදුව ඒ අනුව විත්තිකරු විසින් පැමිණිලිකරුට වර්ෂ 2022.04.26 වැනි දිනට රුපියල් හැටතුන් ලක්ෂ අනූඅට දහස් හාරසිය පනස් නවයයි ශත එකක (රු. 6,398,459.01) මුදලක් සහ වර්ෂ 2022.04.27 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තුරු රුපියල් හැටතුන් ලක්ෂ තිස්දහස් හාරසිය අසූහය (රු. 6,330,486.00) ක මුදලක් මත වාර්ෂිකව 24%ක පොළිය ද සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නඩු ගාස්තු අයකර ගැනීම සඳහා එකී විත්තිකරුගේ ගෙවල්, ඉඩම්, බඩුමුට්ටු අයවිය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් සහ අවශ්‍ය වුවහොත් ලබාගත යුතු බවටත්,

මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ එකී මුදල් ගෙවීම සඳහා බැඳී ඇති බවට හා ඒ සඳහා ඇස්කිසි ක්‍රියාත්මක කළ හැකි බවට ප්‍රකාශයක් ලබා දෙන ලෙසටත්,

(ඈ) තීන්දු ප්‍රකාශයෙ හි සඳහන් දිනයේ සිට මාස දෙකක් ඇතුළත තීන්දු ප්‍රකාශිත මුදල තීන්දු ප්‍රකාශයේ දින සිට මාස දෙකක් ඇතුළත පැමිණිලිකරුට ගෙවීමට විත්තිකරු පැහැර හැරියහොත්, මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපළ ගරු අධිකරණය විසින් අනුමත කරනු ලබන විකුණුම් කොන්දේසි මත ගරු අධිකරණය විසින් පත් කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවකු මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට නියෝග කරන ලෙසටත්,

(ඉ) තව ද,

(i) මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපළ ප්‍රථමයෙන් තක්සේරු කළ වටිනාකමට විකිණීමට තබන ලෙස සහ එම තක්සේරුවට ඉල්ලුම්කරුවන් නොමැති නම් එය විකිණීමට අධිකාරිපත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී තීන්දු ප්‍රකාශය යටතේ අයවීමට ඇති මුදලට එය විකුණන ලෙසට ද, එසේ විකිණීමේ දී ඉල්ලුම්කරුවන් නොමැති වුවහොත් එය වහාම ඊළඟ වැඩිම ඉල්ලුම්කරුට හෝ ඉල්ලුම්කරුවන්ට විකිණීමටත්,

(ii) එම විකිණීමේ දී පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපල වෙනුවෙන් ලංසු තැබීමට සහ මිල දී ගැනීමට පැමිණිලිකරුට හෝ ඒ වෙනුවෙන් වෙනත් ඕනෑම අයෙකුට ඉඩ හැරීමට ද, පැමිණිලිකරු විසින් එය මිල දී ගතහොත්

ඒ සඳහා පැමිණිලිකරු අයැද ඇති ඉල්ලීම් සහ නඩු ගාස්තු සඳහා බැර වාසි ලබා දෙන ලෙසටත්, එකී වෙන්දේසිකරුට නියම කරන ලෙසටත්,

(ඊ) එකී වෙන්දේසිකරුට හෝ අධිකරණය විසින් පත්කර ඇති වෙනත් නිලධාරියෙකුට ගැනුම්කරුගේ නමට නීත්‍යානුකූලව පැවරීමක් කරදීම සඳහා බලය ලබා දෙන ලෙසටත්, එම පැවරීම ගැනුම්කරු පැමිණිලිකරු වුවහොත් අවසර දී ඇති බැර අනුමත කරන නියෝගයක් හා ගැණුම්කරු තුන්වන පාර්ශවක් වුවහොත් අධිකරණයේ විකුණුම් මුදල තැන්පත් කළ යුතු බවට අධිකරණ නියෝගයක් හා විකුණුම් අනුමත කරන නියෝගය ඇතුලත් කිරීම විකිණීමේ කොන්දේසි සපුරා ඇති බවට ලියවිලි ඉදිරිපත් කළ විට සිදු කළ යුතු බවට නියෝග කරන ලෙසටත්,

(උ) ඉහත සඳහන් ලෙස විකිණූ පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපළේ සාමකාමී හා හිස් නිරවුල් භුක්තිය එකී ගැණුම්කරුට භාර දෙන ලෙසට අධිකරණයේ රෙජිස්ට්‍රාර්/පිස්කල් නිලධාරි වෙත නියෝග කරන ලෙසටත්,

(ඌ) විකිණීමෙන් ලත් මුදල පැමිණිලිකරුගේ ඉල්ලීම්, පොළී සහ නඩු ගාස්තු ගෙවීම සඳහා සම්පූර්ණ වශයෙන් යෙදවීමට නියෝග කරන ලෙසටත්,

(එ) මෙම නඩුවේ ඇතුළත් කරනු ලබන තීන්දුවේ විකිණීම පවත්වනු ලබන පුද්ගලයාට සුදුසු සහ අවශ්‍ය වන මොනයම් හෝ වැඩිමනත් මෙහෙයවීම් සහ විකිණීමේ ස්ථානය සහ කොන්දේසි හා ගැණුම්කරු වෙත පැවරීමේ පිළිබඳ හෝ වෙනත් ඕනෑම කාරණාවක් සම්බන්ධයෙන් සහ/හෝ සියළුම ගිණුම් ලබා ගැනීමට හා අධිකරණයට සුදුසු යැයි තීරණය කරනු ලබන සියලුම කාරණාවන් උදෙසා බලය රඳවා ගැනීම සිදු කරන ලෙසට දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසී බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති නිශ්චල දේපල,

**වර්ෂ 2023ක් වූ අගෝස්තු මස 29 වැනි දින ප. ව. 02.00 ට** ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරලයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, දියල්පේ - 364 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දියල්පේ පිහිටි ''පොළයල්හේන කොරටුව'' නැමැති ඉඩමට ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ උසාවි කොමසාරිස් රෝහණ උයන්ගොඩ විසින් සකස් කළ 2021 මාර්තු 31 දිනැති (2021-මාර්තු 26 වැනි දින මනින ලද) අංක 7821 දරන පිඹුරේ නිරූපිත ''ලොට් X'' වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් - උතුරට : මහපොල්යල්හේන ද, නැගෙනහිරට : හම්පතමුල්ල ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද සහ බස්නාහිරට : මහපොල්යල්හේන ද යන මායිම් තුළ පිහිටි අංක 7821 දරන එකී පිඹුරට අනුව පර්චස් 22ක (පර්. 22) හෝ හෙක්ටයාර 0.16187 ක් ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමඟ වේ.

**අංක 7821 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් X දරන කැබැල්ල පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනුමක් වන්නේ ය.**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, දියල්පේ - 364 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දියල්පේ පිහිටි ''පොළයල්හේන කොරටුව'' නැමැති ඉඩමට ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේමාන්න විසින් සකස් කළ 2008 දෙසැම්බර් 27 දිනැති අංක 08/314 දරන පිඹුරේ නිරූපිත ''ලොට් A'' වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : මහපොල්යල්හේන ද, නැගෙනහිරට : හම්පතමුල්ල ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද සහ බස්නාහිරට : මහපොල්යල්හේන ද යන මායිම් තුළ පිහිටි අංක 08/314 දරන එකී පිඹුරට අනුව පර්චස් 22 යි දශම බිංදුවයි නවයකින් (පර්. 22.09) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමඟ වන අතර, මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව Q 26/20හි ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

(01) සම්පූර්ණ ගැනුම් මුදලින් 25% එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
(02) ඉතිරි 75% ලිත් මසක් ඇතුලත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
(03) රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

සමන්තිකා විතානගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාතර.

වර්ෂ 2023ක් වූ ජූලි මස 25 වැනි දින දී ය.

08-259

---

## පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### කොළඹ දිසා අධිකරණයේ දී ය

එස්. එම්. බී. ෆිනෑන්ස් පී. එල්. සී.
(කලින් එස්. එම්. බී. ලීසිං පී. එල්. සී. යනුවෙන් නම් කොට හඳුන්වනු ලබන ලද)

අංක 282/1,
සී.බී.එස්. ගොඩනැගිල්ල,
ගාලු පාර, කොළඹ 03.

*නඩු අංකය* : DMB/00100/2020
*ඇස්කීසි අංකය* : 111/23
*ස්වභාවය* : උකස්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. 10,710,609.08

*..............පැමිණිලිකරු..*

*එදිරිව*

කොටිවත්ත හේවගේ රවීන්ද්‍ර ප්‍රභාත් කුමාර,
අංක 224/3,
වැවේවත්ත, ගොඩව, කඹුරුපිටිය,
ගමගේ වත්ත *නොහොත්* කෝංගහවත්ත,
රදගෙවත්ත *නොහොත්* ගෙදරවත්ත.

*...................විත්තිකරු.*

වර්ෂ 2023 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින මෙම නඩුවෙ හි ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී විත්තිකරුට එරෙහිව ඉහත නම් කර ඇති විත්තිකරුට විරුද්ධව පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති පරිදි පැමිණිලිකරුගේ වාසියට මෙම නඩුව තීන්දු ප්‍රකාශ කරනු ලදුව, ඒ අනුව විත්තිකරු විසින් පැමිණිලිකරුට වර්ෂ 2019.10.21 වැනි දිනට රුපියල් එකසිය හත් ලක්ෂ දස දහස් හයසිය නවයයි ශත අටක (රු. 10,710,609.08) මුදලක් සහ වර්ෂ 2019.10.22 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තුරු රුපියල් එකසිය හය ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය හතරයි ශත අටක (රු. 10,670,304.08) මුදලක් මත වාර්ෂිකව 22%ක පොළිය ද සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නඩු ගාස්තු අය කර ගැනීම සඳහා එකී විත්තිකරුගේ ගෙවල්, ඉඩම්, බඩුමුට්ටු අයවිය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් සහ අවශ්‍ය වුවහොත් ලබාගත යුතු බවටත්,

මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල එකී මුදල් ගෙවීම සඳහා බැඳී ඇති බවට හා ඒ සඳහා ඇස්කීසි ක්‍රියාත්මක කළ හැකි බවට ප්‍රකාශයක් ලබා දෙන ලෙසත්,

(ඇ) තීන්දු ප්‍රකාශයෙ හි සඳහන් දිනයේ සිට මාස දෙකක් ඇතුළත තීන්දු ප්‍රකාශිත මුදල තීන්දු ප්‍රකාශයේ දින සිට මාස දෙකක් ඇතුලත පැමිණිලිකරුට ගෙවීමට විත්තිකරු පැහැර හැරියහොත් මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපල ගරු අධිකරණය විසින් අනුමත කරනු ලබන විකුණුම් කොන්දේසි මත ගරු අධිකරණය විසින් පත් කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවකු මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට නියෝග කරන ලෙසටත්,

(ඉ) තව ද,

(I) මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපළ ප්‍රථමයෙන් තක්සේරු කළ වටිනාකමට විකිණීමට තබන ලෙස සහ එම තක්සේරුවට ඉල්ලුම්කරුවන් නොමැති නම් එය විකිණීමට අධිකාරී පත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී තීන්දු ප්‍රකාශය යටතේ අයවීමට ඇති මුදලට එය විකුණන ලෙසට ද, එසේ විකිණීමේ දී ඉල්ලුම්කරුවන් නොමැති වුවහොත් එය වහාම ඊළඟ වැඩිම ඉල්ලුම්කරුට හෝ ඉල්ලුම්කරුවන්ට විකිණීමට ද,

(II) එම විකිණීමේ දී පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපළ වෙනුවෙන් ලංසු තැබීමට සහ මිල දී ගැනීමට පැමිණිලිකරුට හෝ ඒ වෙනුවෙන් වෙනත් ඕනෑම අයෙකුට ඉඩ හැරීමට ද, පැමිණිලිකරු විසින් එය මිල දී ගතහොත් ඒ සඳහා පැමිණිලිකරු අයැද ඇති ඉල්ලීම් සහ නඩු ගාස්තු සඳහා බැර වාසි ලබා දෙන ලෙසටත්, එකී වෙන්දේසිකරුට නියම කරන ලෙසටත්,

(ඊ) එකී වෙන්දේසිකරුට හෝ අධිකරණය විසින් පත්කර ඇති වෙනත් නිලධාරියෙකුට ගැනුම්කරුගේ නමට නීත්‍යානුකූල පැවරීමක් කර දීම සඳහා බලය ලබා දෙන ලෙසටත්, එම පැවරීම ගැනුම්කරු පැමිණිලිකරු වුවහොත් අවසර දී ඇති බැර අනුමත කරන නියෝගයක් හා ගැනුම්කරු තුන්වන පාර්ශවයක් වුවහොත් අධිකරණයේ විකුණුම් මුදල තැන්පත් කළ යුතු බවට අධිකරණ නියෝගයක් හා විකුණුම අනුමත කරන නියෝගය ඇතුළත් කිරීම විකිණීමේ කොන්දේසි සපුරා ඇති බවට ලියවිලි ඉදිරිපත් කළ විට සිදු කළ යුතු බවට නියෝග කරන ලෙසටත්,

(උ) ඉහත සඳහන් ලෙස විකිණූ පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපලේ සාමකාමී හා හිස් නිරවුල් භුක්තිය එකී ගැණුම්කරුට භාර දෙන ලෙසට අධිකරණයේ රෙජිස්ට්‍රාර්/පිස්කල් නිලධාරී වෙත නියෝග කරන ලෙසටත්,

(ඌ) විකිණීමෙන් ලත් මුදල පැමිණිලිකරුගේ ඉල්ලීම්, පොළී සහ නඩු ගාස්තු ගෙවීම සඳහා සම්පූර්ණ වශයෙන් යෙදවීමට නියෝග කරන ලෙසටත්,

(එ) මෙම නඩුවේ ඇතුළත් කරනු ලබන තීන්දුවේ විකිණීම පවත්වනු ලබන පුද්ගලයාට සුදුසු සහ අවශ්‍ය වන මොනයම් හෝ වැඩිමනත් මෙහෙයවීම් සහ විකිණීමේ ස්ථානය සහ කොන්දේසි හා ගැණුම්කරු වෙත පැවරීමේ පිළිබඳ හෝ වෙනත් ඕනෑම කාරණාවක් සම්බන්ධයෙන් සහ/හෝ සියළුම ගිණුම් ලබා ගැනීමට හා අධිකරණයට සුදුසු යැයි තීරණය කරනු ලබන සියලුම කාරණාවන් උදෙසා බලය රඳවා ගැනීම සිදු කරන ලෙසත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති නිශ්චල දේපළ,

වර්ෂ **2023ක් වූ අගෝස්තු මස 29 වැනි දින පෙ. ව. 10.00** ට ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

ලියාපදිංචි කළ බලයලත් මිනින්දෝරු ඩඩ්ලි ගුණසේකර විසින් සකස් කළ අංක 183 හා 2001.07.24 වැනි දින දරන පිඹුරෙහි ලොට් 1 වශයෙන් පෙන්නුම් කළ දකුණු පළාත, මාතර දිස්ත්‍රික්ක, ගඟබඩ පත්තුවෙහි කඹුරුපිටිය 318A ප්‍රාදේශීය සභාව මායිම් තුළ, ගොඩවෙ ග්‍රාම නිලධාරි වසමේ, ගොඩවෙ ගම්මානයෙහි පිහිටි ''ගමගේවත්ත'' *හෙවත්* ''කෝන්ගහවත්ත'' සහ ''රදාගේවත්ත'' *හෙවත්* ''ගෙදරවත්ත'' නමැති බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ලට මායිම් වනුයේ : උතුරට : කලුගේ වත්ත ද, නැගෙනහිරට : සපුගොඩ සිට ප්‍රධාන පාරට දිවෙන ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය ද, දකුණට : පිඹුරු අංක 183 හි නිරූපිත ලොට් අංක 02 ද, බස්නාහිරට : කලුගේලියද්ද ද, ඉහත කී පිඹුරු අංක 183 අනුව රූඩ් එකයි පර්චස් විසිහතයි දශම හයයි බිංදුවක (රූ. 1 පර්. 27.60) ප්‍රමාණයෙන් යුත් මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ එච්. 83/103 ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කර ඇති ලොට් අංක 01 ලෙස ලකුණු කර ඇති ඉඩම නැවත මැන පහත දක්වා ඇති පරිදි මායිම් වෙන් කර ඇත.

ලියාපදිංචි කළ බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඩී. තිළිණ විසින් සකස් කළ අංක 2103 හා 2018.11.26 දින දරන පිඹුරෙහි ලොට් A වශයෙන් පෙන්නුම් කළ දකුණු පළාත, මාතර දිස්ත්‍රික්ක, ගඟබඩ පත්තුවෙහි කඹුරුපිටිය 318A ප්‍රාදේශීය සභාව මායිම් තුළ, ගොඩවෙ ග්‍රාම නිලධාරි වසමේ, ගොඩවෙ ගම්මානයෙහි පිහිටි ''ගමගේවත්ත'' *හෙවත්* ''කෝන්ගහවත්ත'' සහ ''රදාගේවත්ත'' *හෙවත්* ''ගෙදරවත්ත'' නමැති බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ලට මායිම් වනුයේ, උතුරට : කලුගේ වත්ත සහ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය

(සෞඛ්‍ය මධ්‍යස්ථාන පරිශ්‍රය) ද, නැගෙනහිරට : සපුගොඩ සිට ප්‍රධාන පාරට දිවෙන ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය සහ පිඹුරු අංක 183හි නිරූපිත ලොට් අංක 02 ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්ලි ගුණසේකර විසින් සකස් කළ පිඹුරු අංක 183 හි නිරූපිත ලොට් අංක 02 සහ කලුගේ ලියද්ද ද, බස්නාහිරට : කලුගේලියද්ද සහ කලුගේ වත්ත ද, ඉහත කී පිඹුරු අංක 2103 අනුව රූඩ් එකයි පර්චස් විසිහතයි දශම හයයි බිංදුවක (රූ. 1 පර්. 27.60) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හතයි එකයි බිංදුවක (0.1710 තෙක්) ප්‍රමාණයෙන් යුක්ත වේ.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

(01) සම්පූර්ණ ගැනුම් මුදලින් 25% එම ස්ථානයේ දී ම ගෙවිය යුතුය.
(02) ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාලව අධිකරණයේ තැන්පත් කළ යුතුය.
(03) රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

සමන්තිකා විතානගේ,
අධිකරණ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාතර.

වර්ෂ 2023ක් වූ ජූලි මස 25 වැනි දින දී ය.

08-260

---

# විවිධ දැන්වීම්

## ඈවර කිරීමේ දැන්වීමයි

වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ (කොළඹ දී පැවැත්වෙන) මහාධිකරණයේ (සිවිල්) දී ය

නඩු අංකය : HC (Civil)/51/2023 Co
ස්වභාවය : සමාගම් (ඈවර කිරීම්)
වටිනාකම :

හලාවත, පුත්තලම පාර, තිඹිල්ල එස්ටේට්, අංක 100 දරන ස්ථානයේ පිහිටි ඒ. එස්. ඇග්‍රී එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් පිළිබඳ ඉල්ලීමකි.

*සහ*

1939 ඈවර කිරීමේ රීති සමඟ කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

ඒ. පී. එස්. ලොජිස්ටික්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 77, පාක් වීදිය,
කොළඹ 02.

..................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වර්ෂ 2023/07/12 දිනැති පෙත්සමක් කොළඹ 02, පාක් වීදිය, අංක 77 යන ලිපිනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඒ. පී. එස්. ලොජිස්ටික්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වර්ෂ **2023ක් වූ ජූලි මස 13 වැනි දින** වාණිජ මහාධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ **2023ක් වූ ඔක්තෝබර් මස 23 වැනි දින** අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදළ නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැළකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදයකයෙක් වේ නම් ඒ සඳහා සමාගම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදයකයෙකුට පහත

අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ : කුමුදු රාජපක්ෂ,
කොන්සිලියුම් ඇටර්නීස්,
1395/5, හෝකන්දර පාර, පන්නිපිටිය.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දීම පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙනත් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් කුමුදු රාජපක්ෂ වෙත ගෙනවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම් එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ **2023 ඔක්තෝබර් මස 22 වැනි දින පස්වරු 6.00ට** හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාරදිය යුතුය. *නැතහොත්* එපරිදි තැපෑලෙන් එවිය යුතුය.

කුමුදු රාජපක්ෂ.
කොන්සිලියුම් ඇටර්නීස්,
1395/5, හෝකන්දර පාර, පන්නිපිටිය.

08-515

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි

චන්දිම වීරක්කොඩි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ ''තනතුරු නාම භාවිතා කිරීම'' සංශෝධනය කිරීම සහ තනතුරු නාම භාවිතා කිරීම සමගින් යෝජිත හැඳින්වීම් සහ වෙනස් කිරීම් අනුව අවශ්‍ය වන්නා වූ අනුරූපී සංශෝධන සිදු කිරීමයි.

චන්දිම වීරක්කොඩි,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගාල්ල දිස්ත්‍රික්කය.

08-561

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.